" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599<br>ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk | පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000 |

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date |
| CSWP/FIN-AP/03/FI/02(A) | | 2023.01. 30 |

**බස්නාහිර පළාත්**

**වාපාර චක්‍රලේඛ අංක 02/2023**

**බස්නාහිර පළාතේ,**

**සියළුම ලේකම්වරුන්,**

**පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන වල**

**සභාපතිවරුන් වෙත.**

<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සේවකයන් සඳහා ඉතිරි කරගත් නිවාඩු මත දීමනා ගෙවීම</u>

භාණ්ඩාගාර ලේකම්ගේ 2022.12.21 දිනැති "රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සේවකයන් සඳහා ඉතිරි කරගත් නිවාඩු මත දීමනා ගෙවීම" සම්බන්ධයෙන් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 08/2022 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.01.17 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය පහත සංශෝධනයට යටත්ව බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. 2022.12.21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 08/2022 හි 01 ඡේදයෙහි II හා III වගන්ති සහ 02 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

i. **"එකී රාජ්‍ය ව්‍යාපාරය ප්‍රාග්ධන හා/හෝ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන්/පළාත් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා නොගත යුතුය."** (01 ඡේදයෙහි II )

ii. **"ගෙවීම් සඳහා සලකා බලන වර්ෂයට පෙර වසරට අදාළව පළාත් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ/අයබදු ගෙවා තිබිය යුතුය."** (01 ඡේදයෙහි III )

iii. **"මෙම චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2092639 මඟින් අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) වෙතින් විමසිය යුතුය."** (02 ඡේදය)

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: i. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (බ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (බ.ප.)
v. තොරතුරු තාක්ෂණ නිලධාරී

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.12.21

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 08/2022

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්,**

**<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සේවකයන් සඳහා ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ගෙවීම</u>**

සියලුම රාජ්‍ය ව්‍යාපාර විසින් සිය සේවකයන්ට ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ගෙවීම පහත කොන්දේසිවලට යටත්ව සිදු කළ හැකිය.

I. එකී රාජ්‍ය ව්‍යාපාරයේ සේවකයන්ට හිමි නිවාඩු ගණනය කිරීමේ දී 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

II. එකී රාජ්‍ය ව්‍යාපාරය ප්‍රාග්ධන හා/හෝ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා නොගත යුතුය.

III. ගෙවීම සඳහා සලකා බලන වර්ෂයට පෙර වසරට අදාළව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ/අයබදු ගෙවා තිබිය යුතුය.

2. මෙම චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2484617 මඟින් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසිය යුතුය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. විගණකාධිපති